මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம்,கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2021 – 07 - 14

**මාධ්‍ය නිවේදනයයි**

**ආහාර ද්‍රව්‍ය කීපයකට නව බදු පැනවීමක් සිදුකර ඇති බවට සිදුවන අසත්‍ය ප්‍රචාරය නිවරදි කිරීමයි**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ පාරිභෝගික ජනතාවට නිතර මිල උච්චාවචන වලින් තොරව භාණ්ඩ මිල තිරණය වන පරිදි සහ දේශිය අස්වනු ලැබෙන කාලයන් මත ගොවි ජනතාවට සහ ධිවර ප්‍රජාවට සිය නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලැබෙන පරිදිද , මෙරටට භාණ්ඩ ආනයනයේදී පවතින විවිධ බදු වර්ග වෙනුවට ආනයනකරුවන්ට පහසුවෙන් භාවිතා කළ හැකි තනි බද්දක් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම පනත යටතේ පනවනු ලබන නියෝගයන්, එම පනත ප්‍රකාරව, අදාළ නියෝගය බලපැවැත්වන නිශ්චිත කාල පරිච්ඡේදය අදාළ නියෝගය පළකළ ගැසට් නිවේදනය මගින්ම දැක්විය යුතුව ඇත. මෙම නියෝගවල නිශ්චිතව කාලය අවසන් වූ විට නව නියෝගයක් ගැසට් පත්‍රයක පළ කිරීම නීතිමය අවශ්‍යතාවයකි.

ඒ අනුව, ධිවර අමාත්‍යාංශයේ නිර්දේශයන්ද සැලකිල්ලට ගෙන, මෙරටට ආනයනය කරනු ලබන කරවල සහ ආනයනික හාල්මැස්සන් සඳහා කි. ග්‍රෑමයකට බද්ද රු.100 ක් වූ බද්ද ක්‍රියාත්මක කරන ලද **අංක 2214/58** සහ **2021 පෙබරවාරි මස 11 දිනැති ගැසට් නිවේදනයේ** මාස 06 ක්වූ වලංගු කාලය **2021 අගෝස්තු මස 11 දිනයෙන්** අවසන් වීමට නියමිත වූ අතර, එය **කිසිදු බදු සංශෝධනයකින් තොරව**, එලෙසම නැවත දීර්ඝ කිරීම පමණක් **2021 අගෝස්තු මස 11 දින නිකුත් කරන ලද අංක 2240/20 දරන** ගැසට් නිවේදනයෙන් සිදුකර ඇත.

එයට අමතරව, දේශීය නිෂ්පාදකයින් ආරක්ෂාවන පරිදි, බටර්, උළුහාල්ඇට, කුරක්කන් පිටි, අබ ඇට සහ ලුනු ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බදු පැනවීමට නිකුත් කරන ලද අංක 2195/29 සහ 2020 සැප්තැම්බර් මස 30 දිනැති ගැසට් නිවේදනයේ වසරක් වූ වලංගු කාලය 2021 සැප්තැම්බර් මස 30 දිනයෙන් අවසන් වීමට නියමිතව ඇති අතර එම ගැසට් නිවේදනය සහ දේශීය ලුනු කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා සියළුම භාවිතයන් සඳහා ගන්නා ආනයනික ලුනු සඳහා කි. ග්‍රෑමයට රු. 40 ක බද්දක් පැනවීම සිදු කළද, ඖෂධ නිෂ්පාදනයට ගන්නා විශේෂිත ලුනු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අනුමැතිය මත රු.10 ක් පමණක් ගෙවා ආනයනය කිරීමට බදු සහනයක් ලබාදී ඇති අංක 2206/10 සහ 2020 දෙසැම්බර් මස 16 දිනැති ගැසට් නිවේදනයේ වලංගු කාලය 2021 සැප්තැම්බර් මස 30 දිනයෙන් අවසන් වීමට නියමිතව ඇත.

එකී ගැසට් නිවේදනයන් දෙකෙහි වූ නියෝගයන්ද **කිසිදු බදු සංශෝධනයකින් තොරව** එලෙසම පවත්වා ගෙන යාමට මෙම 2021 අගෝස්තු මස 11 දිනැති අංක .2240/20 දරන ගැසට් නිවේදනය මගින්ම කටයුතු කර ඇත.